## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# රාජ්‍ය ආයතන වෙත කෙරෙන නිවේදනයයි.

### රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ හා සේවා මිලට ගැනීමේ දී
### එකතු කළ අගය මත බදු ගෙවීම සම්බන්ධවයි

ලියාපදිංචි සැපයුම්කරුවන් විසින් අයකර ගන්නා ලද එකතු කළ අගය මත බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු අතර, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි නොවූ ඇතැම් සැපයුම්කරුවන් රාජ්‍ය ආයතන වෙත බදු ඉන්වොසිස් (TAX Invoice) නිකුත් කර ඇති බව දෙපාර්තමේන්තුව විසින් සිදුකළ විමර්ශනවල දී අනාවරණය කරගෙන ඇත.

සියලු භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වී නොමැති අතර, ලියාපදිංචි සැපයුම්කරුවන්ට පමණක් එකතු කළ අගය මත බදු ඉන්වොසිය නිකුත් කල හැක. (TAX Invoice) ලියාපදිංචි නොමැති අනෙක් සියලුම සැපයුම්කරුවන් සාමාන්‍ය ඉන්වොසියි නිකුත් කල යුතුයි.

එබැවින් යම් රාජ්‍ය ආයතනයක් සැපයුම්කරුවන් වෙත එකතු කළ අගය මත බද්ද ගෙවීමේ දී අදාළ සැපයුම්කරු එකතු කළ අගය මත බද්ද සඳහා සත්‍ය වශයෙන් ම ලියාපදිංචි වී ඇත්ද යන්න තහවුරු කර ගත යුතු වේ. ඒ සඳහා

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත්කල එකතු කළ අගය මත බද්දට අදාළ ''ලියාපදිංචි සහතිකය'' පරීක්ෂා කිරීම.
- මේ සම්බන්ධව පැහැදිලි කරගැනීම අවශ්‍ය වේ නම් ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක කොමසාරිස්ගෙන් විමසීම හෝ ප්‍රධාන කාර්යාල දුරකථන අංක : 011-2134250-4 මගින් විමසීම යන,

ක්‍රියාමාර්ග අනුගමනය කල හැක.

**මේ සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරමින් පොදු යහපත සඳහා වූ රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට දායක වන්න.**

වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා **දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් අඩවිය - **www.ird.gov.lk**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**